Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

ශ්‍රේණිය : 6 | විෂය : ගණිතය | සතිය : 12

**පාඩම :- සරල රේඛීය තල රූප**

**කාලච්ඡේද ගණන :- 04**

- ගණිතය දෙවන පෙළපොතේ 1 වන පිටුව හොඳින් අධ්‍යයනය කරන්න. තල රූපයක් යනු කුමක්දැයි හඳුන්වන්න.

> සරල රේඛා ඛණ්ඩ හා වක්‍ර රේඛා ඛණ්ඩ වලින් සමන්විත එකම තලයක අඳින ලද රූප **තල රූප** නම් වේ.


උදා:-




- බෝලයක මතුපිට තලරූපයක් නොවීමට හේතු ලියන්න.

පහත දැක්වෙන රූපවල A හා B ලක්ෂ්‍යයන් දෙක රූපයේ ඇති රේඛා කැපී නොයන සේ යා කිරීමට උත්සාහ කරන්න.

උදා:-





ඉහත රූප අතරින් රූපයේ රේඛා කැපී නොයන සේ යා කල හැකි රූප මොනවාද?

රේඛා ඛණ්ඩවලින් සම්පූර්ණයෙන්ම වට වී ඇති තල රූප 3 ක් අඳින්න.


උදා:-



රේඛා ඛණ්ඩවලින් සම්පූර්ණයෙන්ම වට වී ඇති තල රූපයක් සංවෘත තල රූපයක් ලෙස හැඳින්වේ.


රේඛා ඛණ්ඩවලින් සම්පූර්ණයෙන්ම වට වී නොමැති තල රූප 3 ක් අඳින්න.

උදා:-



රේඛා ඛණ්ඩවලින් සම්පූර්ණයෙන්ම වට වී නොමැති තල රූපයක් විවෘත තල රූපයක් ලෙස හැඳින්වේ.

පහත දැක්වෙන රූප අතරින් සංවෘත රූප හා විවෘත රූප තෝරා ලියන්න.




- ඔබ කැමති සංවෘත රූපයක් අඳින්න. එහි අභ්‍යන්තර ලක්ෂ්‍යයක් හා බාහිර ලක්ෂ්‍යයක් ලකුණු කරන්න.
- ඔබ ඇඳි සංවෘත රූපයේ රේඛා නොකැපෙන සේ මෙම ලක්ෂ්‍ය දෙක යා කල හැකි දැයි බලන්න.
- එමඟින් සංවෘත රූපයක ලක්ෂණයක් හඳුනා ගෙන ඔබේ පන්තියේ වෙනත් අයෙකුට විස්තර කර දෙන්න.

පෙළපොතේ 2 වන පිටුවේ 12.1 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න.

සරල රේඛා ඛණ්ඩවලින් පමණක් සමන්විත තලරූප 3 ක් අඳින්න.


උදා:-



සරල රේඛා ඛණ්ඩවලින් පමණක් සමන්විත සංවෘත තලරූප, සරල රේඛීය සංවෘත තල රූප නම් වේ.

සරල රේඛීය සංවෘත තල රූප නොවන අවස්ථා දැක්වෙන රූප 3ක් අඳින්න.


උදා:-




පෙළපොතේ 3 වන පිටුවේ 12.2 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න. ඔබට මතුවන ගැටළු නිවැරදි කරගන්න.

- පෙළපොතේ 4 පිටුවේ සරල රේඛීය තල රූපවල අංග හොඳින් අධ්‍යයනය කරන්න.

සංවෘත සරල රේඛීය තල රූපයක පාදය, කෝණය නිවැරදිව හඳුනා ගන්න.




පහත රූපයේ දැක්වෙන පාද හා කෝණ හඳුන්වන්න.



පෙළපොතේ 4, 5 පිටු හොඳින් අධ්‍යයනය කරන්න. ත්‍රිකෝණ හා චතුරස්‍රය යනු කුමක්දැයි නිවැරදිව විස්තර කරන්න.

පහත දැක්වෙන රූප හොඳින් නිරීක්ෂණය කරන්න.



ඉහත රූප අනුව පහත වාක්‍යවල නුසුදුසු වචනය කපා දමන්න.

- රූප සියල්ලම සංවෘතය / විවෘතය
- රූප සියල්ලේම රේඛා සරල රේඛීය වේ / නො වේ.
- රූප සියල්ලේම මුලු දෙකක් / තුනක් බැගින් ඇත.
- රූප සියල්ලේම රේඛා ඛණ්ඩ දෙකක් / තුනක් බැගින් ඇත.
- මෙම හැඩයට ත්‍රිකෝණය / චතුරස්‍රය යැයි කියමු.

<u>චතුරස්‍රවල විවිධ අවස්ථා හා ඒවායේ ලක්ෂණ අනුව චතුරස්‍ර වර්ග හඳුනා ගැනීම.</u>

පෙළපොතේ 5,6,7 පිටු හොඳින් අධ්‍යයනය කරන්න. එහි දැක්වෙන ලක්ෂණ අනුව,

ත්‍රපීසියම<br>
සමාන්තරාස්‍රය<br>
රොම්බසය<br>
ඍජුකෝණාස්‍රය<br>
සමචතුරස්‍රය

යන චතුරස්‍රවල ලක්ෂණ හඳුනා ගනිමින් ඒවායේ රූප සටහන් අඳින්න. එක් එක් චතුරස්‍රයේ විශේෂ ලක්ෂණ ලියන්න.

පෙළපොතේ 7 වන පිටුව බලන්න. 12.3 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න.
ඔබ සම්පූර්ණ කල අභ්‍යාසය ගුරුතුමා සමඟ සාකච්ඡා කර ගැටලු අවස්ථා නිවැරදි කරගන්න.

පෙළපොතේ 9 වන පිටුවේ දැක්වෙන පාඩමට අදාල සාරාංශය හොඳින් කියවන්න. තවදුරටත් සරල රේඛීය සංවෘත තල රූපවල ලක්ෂණ හඳුනාගන්න.